**දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - 2019**

-----------------------------------------------------------

දකුණු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3027 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දකුණු අධිවේගයට සම්බන්ධවන කිලෝමීටර් 45.52 ක මාර්ග පුනරුත්ථාපනය හා යාවත්කාලීන කිරීම තුළින් ජාතික ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,248 කට සමාන එජඩො මිලියන 95 ක් වන අතර, එම මුදලින් රු.මිලියන 9,025 කට සමාන එජඩො මිලියන 70 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 22 දින ආරම්භ කළ අතර, 2018 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිත විය.කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2021 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

------

මාගේ මතය, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයන් තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

## 1.4 මතය සඳහා පදනම

--------------------

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට (ශ්‍රී.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම ,මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 44 වන ඡේදයට අනුව, ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගත් අගය වාර්තා කරන දිනට පවතින ප්‍රවර්තන බැඳීම පියවීම පිණිස අවශ්‍ය වියදම් වල හොඳම ඇස්තමේන්තුව විය යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ඉහත අවශ්‍යතාවයට පටහැනිව කොන්ත්‍රාත් පැකේජ 02 හි 2019 නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා වන අතුරු ගෙවීම් සහතික දෙකකට අදාලව රු.මිලියන 17.85 ක් අඩුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ගිණුමට ප්‍රතිපාදන සිදුකර ඇත. | 17.85 | කෙරීගෙන යන වැඩ ගිණුම සහ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ගිණුම අඩුවෙන් දක්වා ඇත. | විසර්ජන ගිණුම් සකස් කරන අවස්ථාවේදී උපදේශක විසින් ලබා දුන් වටිනාකම මත ප්‍රතිපාදනය සිදුකර තිබුණි. ප්‍රතිපාදනය කරන අවස්ථාවේදී 2019 නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන්හි කරන ලද වැඩ සඳහා බිල්පත් ලබා දී නොතිබුණි. එබැවින් රු.මිලියන 17.85 ක **ඌන** ප්‍රතිපාදනය පිළිගනී. | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සිදුකරන විට ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුගමනය කිරීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල භෞතික ප්‍රගතිය**

| අංක | සංරචක/ උප සංරචක | 2019 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | 2019 දෙසැම්බර් 31 දිනට අත්පත්කර ගත් කාර්ය සාධනය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| (අ) | කිරුලපන - හෝමාගම සහ කැස්බෑව - පොකුණුවිට මාර්ග ඉදිකිරීම් වැඩ | 100% | 98% | කොන්ත්‍රාත් පැකේජ 02 සහ 04 හි ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 31 දිනට අවසන් කර නොතිබුණි. | මාර්ග පුනරුත්ථාපන කටයුතු ප්‍රමාදයකින් යුතුව නිම කිරීමේ හා ව්‍යාපෘති පිරිවැය ඉහල යාමේ හැකියාවක් ඇත. | කොන්ත්‍රාත් පැකේජ 02 යටතේ කිරුලපන - හෝමාගම මාර්ගයේ කිලෝමීටර් 16.18 ක පුනරුත්ථාපන කටයුතු 2020 පෙබරවාරි 29 නිමකරන ලදි. කොන්ත්‍රාත් පැකේජ 04 යටතේ අඹතලේ සිට සිනෙක් මංසන්දිය මාර්ගයේ කිලෝමීටර් 1.88 ක පුනරුත්ථාපන කටයුතු ඉතිරි වැඩ කිහිපය නිමකල වහාම භාරදීමට නියමිතය.ප්‍රමාදය සඳහා ප්‍රමාද ගාස්තු අඩුකර ඇත. | ඉලක්කගත දිනයන්හි වැඩ නිම කිරීම සඳහා මාර්ග පුනරුත්ථාපන කටයුතු කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අඹතලේ - සිනෙක් මංසන්දිය මාර්ගයේ ඉදිකිරීම් වැඩ | 100% | 99% | | | | |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංක | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| ----- | ---------------------- | ---------- | -------------------------------- | ------------ |
| (අ) | පැකේජ 03 හි අනුමත සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 2,056 ක් වුවද, සහතික කල කොන්ත්‍රාත් ගෙවීම් රු. මිලියන 2,279.8 දක්වා රු. මිලියන 223.8 කින් වැඩිවී තිබුණි. ප්‍රතිඵලයක් ලෙස, අවසන් ගෙවීමට අදාලව අංක 29 දරන අතුරු ගෙවීම් සහතිකය යටතේ 2019 ජුනි 24 වන දින ඉදිරිපත් කරන ලද රු. මිලියන 248.6 ක මුදලක් ව්‍යාපෘතිය විසින් නොපියවා 2019 දෙසැම්බර් 31 වන විටත් නොගෙවූ වගකීමක් ලෙස පැවතුනි.තවද, ඉහත සඳහන් අතුරු ගෙවීම් සහතික අංක 29 ගෙවීම ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත්කරු විසින් පොළිය ඉල්ලා 2019 ඔක්තෝබර් 31 දින අතුරු ගෙවීම් ඉල්ලීම් අංක 30 ඉදිරිපත්කර තිබූ බව නිරීක්ෂණය විය. | ප්‍රමාද ගෙවීම් සඳහා පොළිය වැඩිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යාමේ හැකියාවක් ඇත. | 2018 ඔක්තෝබර් 25 දින පැවති ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුව, මුල් කොන්ත්‍රාත් වටිනාකම වන රු. මිලියන 1,796 ට වඩා වැඩියෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව විසින් සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 2,056 සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | පොළී පිරිවැය අවම කිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ප්‍රමාදයකින් තොරව වගකීම පියවා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පැකේජ 01 හි කොන්ත්‍රාත්කරුගෙන් අයකරගත් රු. මිලියන 31.95 ක ප්‍රමාද ගාස්තු පසුව 2019 නොවැම්බර් මස අතුරු ගෙවීම් සහතික අංක 16 යටතේ කොන්ත්‍රත්කරු වෙත නිදහස් කර තිබුණි.කෙසේවෙතත්, පවරා ගැනීමේ සහතිකය සමඟ කොන්ත්‍රාත්කරුට නිකුත්තර ඇති ඉතිරි වැඩ ලැයිස්තුව සිදුනොකිරීම නිසා ප්‍රමාද ගාස්තු නිදහස් කිරීමට උපදේශකගේ අනුමැතිය ලබා දී නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් සපයන ලද කාර්ය සාධන සුරක්ෂණය 2018 ජූලි 13 දිනෙන් කල් ඉකුත්වී ඇති බව නිරීක්ෂණය විය. | අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වල කිරීම. | රු. මිලියන 31.95 ක ප්‍රමාද ගාස්තු නිදහස් කිරීමට පෙර කාලය දීර්ඝ කිරීම් අනුමතකර තිබුණි. (ඔබගේ අවදානය සඳහා අනුමැතියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.) කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කිරීම් ඉල්ලා මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි.ලේකම් විසින් මෙම කාලය දීර්ඝ කිරීම් ඇගයීම සහ නිර්දේශ ලබා දීම සඳහා කමිටුවක් පත්කර තිබූ අතර ලේකම් විසින් මෙම කාලය දීර්ඝ කිරීම් සහනයක් ලබාදෙන පදනම මත අනුමත කර ඇත. කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් සහ අඩුපාඩු වගකීම් කාලසීමාව කාර්ය සාධන සුරක්ෂණය මඟින් ආවරණය කර ඇත. එය කාර්ය සාධනය මත පදනම් වූ නඩත්තු කාලසීමාවද ආවරණය කල යුතු අතර එය ඉදිරිපත් කිරීමට දැනටමත් දැනුම් දී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් කර ඇති ගෙවීම් කොන්දේසි අනුගමනය කල යුතුය. කොන්ත්‍රාත්කරු සඳහා වන සෑම ගෙවීමක් සඳහාම උපදේශකගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් පැකේජ 01 හි ප්‍රමාණ පත්‍රයේ ඇතුලත් රු. මිලියන 134.32 ක් වටිනා අයිතම 235 ක් යටතේ ඉදිකිරීම් වැඩ සහ කොන්ත්‍රාත් පැකේජ 03 හි ප්‍රමාණ පත්‍රයේ ඇතුලත් රු. මිලියන 150 ක් වටිනා අයිතම 198 ක් යටතේ වූ ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත්කරු විසින් සිදුකර | කොන්ත්‍රාත් පිරිවැය වැඩිවිය හැකිය. | ස්ථාන පරීක්ෂාවකින් සහ ස්ථාන විමර්ශනයන් කිහිපයකින් පසුව ලබා ගෙන ඇති තොරතුරු මෙන්ම උපකල්පන කිහිපයක් සමඟ ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කරනු ලැබේ.කෙසේවෙතත්, භූමියේ වැඩ ආරම්භ කරන විට සමහර අපගමනයන් විය හැකි අතර සමහර අයිතම සිදු කිරීමට අවශ්‍යා නොවිය හැකිය.සමහර නව අයිතම එකතු විය හැකි අතර පවතින අයිතම වල ප්‍රමාණය වැඩි විය හැකිය. අඩු වියදමකින් හොඳ තත්ත්වයේ මාර්ගයක් ඉදිකිරීමේ අරමුණින් භූමියේදී ඇතැම් තීරණ ගත යුතුය. ප්‍රමාණ පත්‍රයේ ඇති වෙනත් | ප්‍රමාණපත් සකස් කිරීමට පෙර සවිස්තරාත්මක ඉංජිනේරු අධ්‍යනයක් සහ පාංශු පරීක්ෂණ සිදුකිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | නොතිබුණි. ඒ අනුව, රු. මිලියන 42.65 ක් වටිනා සිදු නොකරන ලද වැඩ සඳහා සවලීකරණ අත්තිකාරම් ලබා ගැනීමෙන් කොන්ත්‍රාත්කරුවන්ට අමතර වාසි ලබාගැනීමට ඉඩ සැලසීම මඟින් පෙනීයන්නේ කොන්ත්‍රාත් පැකේජවල ඉංජිනේරු ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර නොමැති බවයි. | | අයිතම මඟින් සිදුනොකරන ලද අයිතම ආවරණය වන නිසා කොන්ත්‍රාත් පැකේජ 01 සහ කොන්ත්‍රාත් පැකේජ 03 යටතේ සවලීකරණ අත්තිකාරම් වැඩියෙන් ගෙවා නොමැත. | |
| (ඇ) | ලැබී ඇති තෙරතුරු අනුව, රජයට අයත් ඉඩම් කැබලි 548 ක් ඇතුලුව ඉඩම් කැබලි 3,558 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබූ අතර එයින් ඉඩම් කැබලි 2,590 කට ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ රු. මිලියන 3,205.3 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. තවද, ඉඩම් අත්පත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුවල තීරණ යටතේ රු. මිලියන 1,742.47 ක අතිරේක ගෙවීම් සිදුකර තිබුණි. මීට අමතරව, 2019 දෙසැම්බර් 31 දක්වා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත පොළී | වන්දි ලෙස අමතර පිරිවැයක් දැරීමට සිදුවිය හැක. | ලබා දී ඇති තොරතුරු නිවැරදි වන අතර එකඟවේ. අරමුදල් ලබා ගැනීමේ හැකියාව මත පදනම්ව ඉතිරි ඉඩම් සඳහා වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට පෙර අත්පත් කරගත් ඉඩම් සඳහා නියමිත පොළී ගෙවීම් සම්පූර්ණයෙන් පියවිය යුතුය. | ඉඩම් අත්පත් කර ගැනීමේ ඉතිරි කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් පියවර ගත යුතුය. |

වශයෙන් රු. මිලියන 2.24 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ කිසිදු ඉඩමක් ලියාපදිංචි කර නොතිබුණි.